**ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය - 2023**

**-----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි 54 ඡේදය ප්‍රකාරව වත්කම් පන්තියකට අයත් එක් වත්කමක ප්‍රත්‍යාගණිත අගය වැඩි වීම හෝ අඩුවීම, එම වත්කම අයත් පන්තියේම වෙනත් වත්කමක අගයට හිලව් කළ යුතු බව දක්වා ඇතත්, සමාලෝචිත වර්ෂයේ රසායනාගාර හා පර්යේෂණ උපකරණ පන්තියේ උපකරණවල ප්‍රත්‍යාගණන අගය වැඩිවීම් හිමිකමේ වැඩිවීමක් ලෙසත්, අගය අඩුවීම කාර්යසාධන ප්‍රකාශනයේ ඌනතාවය ලෙසත් දැක්වීම නිසා වර්ෂයේ ඌනතාවය රු.553,930 කින් සහ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හිමිකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | පසුගිය වර්ෂයේ රසායනාගාර හා පර්යේෂණ උපකරණවල ප්‍රත්‍යාගණ අගය අඩුවීම කාර්යයසාධන ප්‍රකාශනයට හර කර තිබීම නිසා ඌනතාවයෙහි සිදුවී ඇති අඩුවීම හා හිමිකම් වල දැක්වෙන ප්‍රත්‍යාගණන සංචිතයේ වැඩිවීම ජ'නල් සටහන් යොදා නිවැරදි කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 54 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2023 වර්ෂයේ සහ දැනට ක්‍රියාත්මක වෙමින් පවතින SSTC Pilot Project Phase-(iv) යන සංවර්ධන ව්‍යාපෘතිය සඳහා මිලට ගනු ලැබූ Grid Solar Power System එකක් අත්පත් කරගැනීම වෙනුවෙන් දැරූ රු.2,690,000 ක වියදම කෙරීගෙන යන වැඩ ගිණුමට හර කිරීම වෙනුවට කාලච්ඡේදයේ වියදමක් | 2024 වර්ෂයේ පෙබරවාරි මාසයේදී මෙම සූර්ය පැනල පද්ධතිය භාවිතයට ගත හැකි ආකාරයට ලංකා විදුලිබල මණ්ඩලයෙන් අදාල සම්බන්ධතාවය ලබා දුන් පසු | සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් දරන ලද වියදම් හා ව්‍යාපෘතිය නිම නොවී පවතින්නේ නම් එකී වියදම් කෙරීගෙන යන වැඩ ලෙස ජංගම |

| | | |
|---|---|---|
| ලෙස සලකා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ව්‍යාපෘති සංවර්ධන වියදමක් යටතේ දැක්වීම තුළින් වර්ෂයේ ඌනතාවය රු.2,690,000 ක් වැඩියෙන්ද, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ ඇති කෙරීගෙන යන වැඩ එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද දැක්විණි. | ආයතනයේ වත්කමක් ලෙස ගිණුම්ගත කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | නොවන වත්කම් යටතේ දැක්විය යුතුය. |
| (ආ) කාලච්ඡේදයේ පාරිතෝෂික වියදම ලෙස අඩුකළ රු.3,113,795 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා ඇති කාලච්ඡේදයේ ශුද්ධ අතිරික්තයට/ ඌනතාවයට මූල්‍ය නොවන ගනුදෙනු වශයෙන් එකතුකළ යුතු වුවත්, එසේ සිදු නොකොට මූල්‍ය ක්‍රියාකාරකම් වලින් පැන නැගුණු මුදල් ප්‍රවාහ යටතේ රු.956,630 ක් පාරිතෝෂික වෙන්කිරීම් වැඩිවීම් ලෙස එකතු කර ඇත. | පාරිතෝෂිත වියදම මඟින් සිදු වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේ දී එහි ශුද්ධ බලපෑම මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමේදී දක්වා ඇත. විගණනය පෙන්වා දී ඇති ආකාරයෙන් ඉදිරි වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමට කටයුතු කරමි. | පාරිතෝෂිත වියදම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය නොවන ගනුදෙනු වශයෙන් එකතු කර දැක්විය යුතුය. |

## 1.6 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| **විෂයය** | **මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම**<br>**රු.** | **අනුරූපී වාර්තා අනුව වටිනාකම**<br>**රු.** | **වෙනස**<br>**රු.** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|---|
| **අභ්‍යන්තර පාඨමාලා, දේශන ශාලා, ආහාරපාන සහ නේවාසික ගාස්තු** | 4,681,887 | 4,440,074 | 241,813 | ලේඛනය නිවැරදි කරගැනීමට මෙන්ම මෙවැනි දෝෂයක් ඉදිරියේදී සිදු නොවීමට කටයුතු කරන ලෙසට අදාළ නිළධාරීන් වෙත උපදෙස් ලබා දෙන ලදි. | උපයෝගී ලේඛනවල නිවැරදිතාවය තහවුරු කර ගැනීමෙන් පසු ගිණුම්වලට පිටපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.35,500,537 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.15,193,030 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.20,307,507 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් ප්‍රාග්ධන ප්‍රදාන රු.10,234,226 කින් වැඩි වුවද,ක්‍රමක්ෂය රු.20,803,474 කින් අඩුවීම, වෙනත් වියදම් රු.5,120,243 කින් වැඩිවීම සහ ව්‍යාපෘති සංවර්ධන වියදම් රු.15,540,646 ක් වැඩිවීමද ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ ශ්‍රී ලංකාවේ කෘෂි බෝගවල සැපයුම් හා අගයදාම කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා 2018 අප්‍රේල් 05 දින රු.1,290,000 ක් වැය කර Gps Trackers unit 100 ක් හා 2018 මාර්තු 22 දින රු.4,680,000 ක් වැයකර Tempered Data Lorggers 130 ක් මිලට ගෙන තිබුණි. විධිමත් ශක්‍යතා අධ්‍යනයක් කර මිලදීගත් එකී උපකරණ භාවිතයට නොගැනීම නිසා රජයට පාඩුවක් සිදුවී ඇති බැවින් එම උපකරණ මිලදී ගැනීමට නිර්දේශකළ, අනුමත කළ සහ වගකිව යුතු අනෙකුත් පාර්ශව සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. තවද අමාත්‍යාංශයේ පැවති විගණන හා කළමනාකරණ කමිටුවේ අවධානයද යොමුවී ඇතත්, 2024 අප්‍රේල් 01 දින වනතුරුත් මේ සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු අතර එම ව්‍යාපෘතිය සඳහා වැයකර තිබූ රු.7,292,832 ක්වූ සමස්ත වියදම ආයතනයට ආර්ථික නොවූ වියදමක් බවට පත්වී තිබුණි. | උක්ත ව්‍යාපෘතිය යටතේ Tempered Data Loggers 100 සහ GPS Trackers 100 මිලදී ගන්නා ලදී. Tempered Data Loggers මිලදී ගනු ලැබුවේ රටපුරා එළවළු පලතුරු සැපයුම් දාමවල ප්‍රවාහනයේදී හා පරිහරණයේදී සිදුවන උෂ්ණත්ව විචලනය අධ්‍යනය කිරීමටය. GPS Trackers මගින් එළවළු පලතුරු සැපයුම් දාමය තුළ කෘෂි නිෂ්පාදන ගමන් කරන ආකාරය පිළිබඳ අධ්‍යයනය කිරීමට බලාපොරොත්තු විය.<br>GPS Trackers ක්‍රියාත්මක කිරීම සඳහා සිම් පත් (Data) අවශ්‍ය වන අතර, 2018 වර්ෂයේදී මිලදී ගැනීමේ කටයුතු සිදු කිරීමට නොහැකි වූ හෙයින් 2019 වර්ෂයේදී මෙම ව්‍යාපෘතියට අදාළ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ව්‍යාපෘති යෝජනා කෘෂිකර්ම අමාත්‍යාංශයට ඉදිරිපත් කලත් ඒ සඳහා අරමුදල් නොලැබීම සමඟ පැවති කොවිඩ් 19 වසංගතය නිසා අපේක්ෂිත ලෙස එම උපකරණ යොදාගෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.<br>මේවායේ කොටසක් ආයතනයේ විවිධ කාර්යයන් සඳහා යොදාගන්නා ලද අතර ඉතිරි උපකරණ අවශ්‍ය වෙනත් කෘෂිකාර්මික පර්යේෂණ සිදුකරන ආයතනය වෙත ලබාදී ඇත.<br>මෙවැනි තත්ත්වයන් අනාගතයේ ඇතිවීම වලක්වා ගැනීම සඳහා ව්‍යාපෘති යෝජනා සකස් කිරීමේදී වඩා හොඳ සක්‍යතා අධ්‍යනයක් කරන ලෙසට අදාළ නිලධාරීන්ට නියෝග නිකුත් කර ඇත. | විගණන නිරීක්ෂණය සමාලෝචනය කර නිරවුල් කිරීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයන් ගත යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2015 වර්ෂයේදී විද්‍යාගාර පර්යේෂණ කටයුතු සඳහා රු.15,216,575 කට මිලදීගෙන තිබූ හා වාර්ෂිකව රු.275,000ක නඩත්තු | මෙයින් දක්වා ඇති Gas Chromatography Mass Spectrometer යන්ත්‍රය මේ වන විට ආයතනයේ සිදු කරනු ලබන පර්යේෂණ ව්‍යාපෘති සඳහා භාවිතා කිරීම සිදු කරයි. | යන්ත්‍රය අඛණ්ඩව භාවිතයට ගැනීම හෝ ප්‍රයෝජනවත් රාජ්‍ය ආයතනයක් |

| | | |
|---|---|---|
| වියදමක් දරමින් පූර්ණ වායුසමන තත්ත්වයක පවත්වා ගෙන යන Gas Chromatograph Mass Spectrometer (GCMS) යන්ත්‍රය විගණිත දින වූ 2023 මාර්තු 20 දින විට අවස්ථා කිහිපයකදී හැර භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. මෙම යන්ත්‍රය මිලදී ගෙන වර්ෂ 09 කට ආසන්න කාලයක් ගත වී ඇතත්, යන්ත්‍රය ප්‍රයෝජනවත් රාජ්‍ය ආයතනයක් වෙත ලබාදීමේ හැකියාව පිළිබඳවද ඉහළ කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි. | 2023 වසරේදී මෙන්ම 2024 වසරේද සිදු කරනු ලබන පර්යේෂණවල නියැදි විශ්ලේෂණය සඳහා මෙම යන්ත්‍රය මේ වන විට භාවිතා කරනු ලැබේ. ඌන උපයෝජිත තත්ත්වයෙන් වලක්වා ගැනීම සඳහා පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරන ලදී. එම සැලසුම අනුව 2022/2023/2024 වර්ෂ වලදී පර්යේෂණ 05 ක් සිදු කරන ලදී. තවද සාම්පල විශ්ලේෂණ කටයුතු සඳහාද මෙම යන්ත්‍රය භාවිතා කරන බව වැඩිදුරටත් දන්වා සිටිමි. | වෙත පැවරීමට කළමනාකරණය අවධානය යොමුකළ යුතුය. |
| (ආ) ජාතික පසු අස්වනු කළමණාකරන ආයතනයේ ක්‍රියාත්මක පර්යේෂණ අංශය මඟින් පර්යේෂණ ක්‍රියාවලියකින් පසුව නව උත්පාදන නිෂ්පාදනය කර සමාජගත කිරීම ප්‍රධාන අරමුණක් වේ. නමුත් සිදුකරන ලද විගණන පරීක්ෂාවේදී 2000 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා වූ වර්ෂ 24ක කාලය තුළ යාන්ත්‍රික වැඩපොළේ පවත්වාගෙන යන නිෂ්පාදිත යන්ත්‍ර සහ උපකරණ ලේඛනය අනුව එළිදක්වා ඇති නව උත්පාදන යන්ත්‍ර වර්ග 19 න් එක් යන්ත්‍ර වර්ගයක් පමණක් සමාජ ගත කර තිබුණි. | දේශීය යන්ත්‍ර නිෂ්පාදනයේදී යොදාගන්න අමුද්‍රව්‍ය මිල අනෙකුත් රටවලට සාපේක්ෂව ඉහළ අගයක් ගන්නා බැවින් විදෙශියෙන් ගෙන්වන ආදේශක යන්ත්‍ර දේශීය නිෂ්පාදිත යන්ත්‍ර වලට සාපේක්ෂව ඉතා අඩු මිලකට අලෙවි කරන බැවින් මෙම යන්ත්‍ර සමාජගත කිරීම අපහසුතවයක්ද පවතී. තවද මෙම බොහෝ යන්ත්‍ර පර්යේෂණ මගින් හඳුන්වා දී අවුරුදු 10 කට වඩා පැරණි අතර මේ වන විට මෙම යන්ත්‍ර වලට වඩා ඉහල තාක්ෂණයෙන් යුත් ක්‍රියාකාරී යන්ත්‍ර බිහි වී ඇති බැවන් ද මෙම යන්ත්‍ර සමාජ ගත කිරීම අපහසු වී ඇත. | සමාජ අවශ්‍යතාවය හඳුනාගෙන යන්ත්‍ර නිපදවීමටත්, ඒවා කර්යක්ෂම සමාජගත කරමින් ආයතනයේ කාර්යසාධනය ඉහළ නැංවීමටත් කටයුතු කළ යුතුය. |
| (ඇ) පර්යේෂණ අංශය මඟින් පර්යේෂණ ක්‍රියාවලියකින් පසුව නව උත්පාදන නිෂ්පාදනය කර සමාජගත කිරීම ප්‍රධාන අරමුණ වුවද, 2000 වර්ෂයේ 2023 වර්ෂය දක්වා කාලය තුළ යන්ත්‍ර හා උපකරණ 09 ක් සඳහා පමණක් පේටන්ට් බලපත්‍ර ලබාගෙන තිබුණි. | 2000 හා 2021 යන කාලය තුළ පේටන්ට් බලපත්‍ර 09 ක් ලබා ගෙන ඇති අතර, ඒවා සියල්ල යන්ත්‍ර හා උපකරණම නොවන අතර අගය වැඩිකල නිෂ්පාදන හා නිෂ්පාදන ක්‍රමවේදයන්ද ඒ අතර වේ. සිදු කරන සියලුම පර්යේෂණවල ප්‍රතිඵලයන්හි අවසානය පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම නොවන අතර, එම ප්‍රතිඵල සමහරක් ආයතනයේ පුහුණු හා ව්‍යාප්ති අංශය මඟින් අවශ්‍යතා අනුව ක්ෂේත්‍රයට ලබා දීම සිදු කරයි. | පර්යේෂණ ප්‍රතිඵල සමාජගත කිරීමේ වැඩපිළිවෙල සහ පේටන්ට් බලපත්‍ර ලබාගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කළ යුතුය. |
| (ඇ) පළතුරු වටිනාකම් දාමයේ පාර්ශවකරුවන් සවිබල ගැන්වීම සඳහා පළතුරු සැකසුම් මධ්‍යස්ථානයක් පිහිටුවීම පිළිබඳ පරීක්ෂණය පිළිබඳ රු.මිලියන 27.81 ක් වූ ව්‍යාපෘති යෝජනාව | | |

| | | |
|---|---|---|
| ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය විසින් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත 2023 මාර්තු 07 දින ඉදිරිපත් කොට අනුමත කරවාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) ආයතනයේ පර්යේෂණ නිලධාරීන් 14 දෙනෙකු සිටින ලද නමුත් ව්‍යාපෘතිය අනුමත කිරීමට පෙර එකී නිලධාරීන් මඟින් ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකොට 5 ඡේදයෙහි ප්‍රාථමික ක්‍රියාකාරකම් යටතේ ශක්‍යතා අධ්‍යනයක් අනවශ්‍ය බව දක්වා ව්‍යාපෘති යෝජනාව අනුමත කර රු. මිලියන 1.0712 ක් ශක්‍යතා අධ්‍යනය සඳහා කර්මාන්ත සේවා කාර්යාංශය වෙත උපදේශන සේවා ලබා ගැනීමේ ගාස්තුව වශයෙන් රු.970,000 ක් ගෙවා තිබුණි. | මෙම කටයුත්ත සිදුකිරීමට සමාජ විද්‍යාව හා ආර්ථික විද්‍යාව සම්බන්ධ ප්‍රවීනයින් ආයතනය සතුව නොමැති වීමත් හේතුවෙන් මෙම ශක්‍යතා අධ්‍යනය බාහිර පාර්ශවයක් මඟින් සිදුකර ගැනීමට තීරණය විය. | විගණන නිරීක්ෂණයන් සමාලෝචනය කර නිරවුල් කිරීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් ගත යුතුය. |
| (ii) ව්‍යාපෘති යෝජනාව අනුමත කර ගන්නා අවස්ථාවේදී ව්‍යාපෘති යෝජනා ආකෘති පත්‍රයේ 4 වන ඡේදය මඟින් භූමිය අත්පත් කර ගැනීම අනවශ්‍ය බව දක්වමින් 2023 මාර්තු 07 දින යෝජනාව අනුමත කර මාස 05 කට පසු 2023 අගෝස්තු 16 දින හම්බන්තොට ප්‍රාදේශීය සභාව සමඟ එකඟතාවට පැමිණ එම ප්‍රාදේශීය සභාවට අයත් මයුරපුර පොළ භූමියේ පිහිටි නව ගබඩාව සහ එම මීටර් 32.1 x 18.2 ක් වන භූමි ප්‍රමාණය ප්‍රතිපාදන අනුමත කිරීමකින් තොරව භාවිතය සඳහා අත්පත් කර ගැනීමට කටයුතු කිරීමට එකඟතා ලබාගෙන තිබූ අතර, ව්‍යාපෘතියේ මුළු ප්‍රතිපාදනයෙන් එකී ගොඩනැගිලි අලුත්වැඩියාව සඳහා අනුමත ඉංජිනේරු ඇස්තමේන්තුවක් රහිතව රු.මි.20 ක් වෙන්කර තිබුණි. | මෙම ව්‍යාපෘති යෝජනාව සකස්කරන අවස්ථාවේදී පලතුරු පල්ප සැකසුම් මධ්‍යස්ථානය පිහිටුවීමට සුදුසු ගොඩනැගිල්ල ලෙස මහවැලි අධිකාරියට අයත් ගොඩනැගිල්ලක් හඳුනාගෙන ඇස්තමේන්තුවක් සකස් කරන ලදී. කෙසේ වුවද එම ගොඩනැගිල්ල ලබා ගැනීමට යාමේදී ඇති වූ ගැටළුකාරී තත්වය මත හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ භාවිතයට නොගත් ගොඩනැගිල්ලක අළුත්වැඩියාවන් කර අවශ්‍ය අංග එක්කර සකස් කර තිබූ ඇස්තමේන්තුවට අදාළ කටයුතු සිදු කරන ලදී. මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර ප්‍රාදේශීය සභාව සමග එම ගොඩනැගිල්ල හා අවට වපසරිය භාවිතා කිරීමට ගිවිසුම් ගතව සිදු කරන ලදී. | විගණන නිරීක්ෂණය සමාලෝචනය කර නිරවුල් කිරීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් ගත යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කෘෂි භෝගවල පසු අස්වනු හානිය අවම කිරීම ආයතනයේ ප්‍රධාන අරමුණක් වූ අතර, ඒ වෙනුවෙන් 2009 වර්ෂයේ සිදුකර තිබූ මූලික සමීක්ෂණයකට අනුව කල් තබාගත නොහැකි කෘෂි බෝගවල පසු අස්වනු හානිය සියයට 30 ත් සියයට 40 ත් අතර පැවති බව හඳුනාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන්වන විට එම සමීක්ෂණය සිදුකර වසර 14 ක කාලයක් ගතවී තිබූ අතර, 2023 දෙසැම්බර් 31 දින වන විට ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය විසින් පසුඅස්වනු හානිය අවම කිරීම සඳහා ගෙන ඇති ක්‍රමවේදයන් මඟින් හඳුනාගෙන තිබූ පසුඅස්වනු හානිය අවම කරගෙන තිබූ ප්‍රමාණය ප්‍රතිශතයක් වශයෙන් කොපමණද යන්න හඳුනාගත හැකිවන අන්දමේ දත්ත සමුදායක් ආයතනය සතුව නොතිබුණි. | කෘෂි බෝග වල පසු අස්වනු හානියේ වර්ථමාන තත්වය පිළිබඳ දීප ව්‍යාප්ත අධ්‍යයනයක් 2021-2023 කාලයේදී ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය විසින් කරන ලදි. පසුගිය වසර කිහිපය තුල පසු අස්වනු හානිය අවම කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග මගින් එම බෝග වල පසු අස්වනු හානිය අඩු වී ඇති ප්‍රමාණ පිළිබඳ දත්ත ලබා ගන්නා ලදි. මේ පිළිබඳ අවසාන වාර්ථාවක් ආයතනයට ඉදිරිපත් කර ඇති අතර සංෂිප්ත වාර්ථාවක් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ලබා දී ඇත. එමෙන්ම පසු අස්වනු හානියේ වර්ථමාන තත්වය පිළිබඳ මෘද්‍රිත මාධ්‍ය තුලින්ද දැනුවත් කර ඇත. | විගණන නිරීක්ෂණයන් සමාලෝචනය කර නිරවුල් කිරීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයන් ගත යුතුය. |
| (ආ) පර්යේෂණ නිලධාරියාගේ කාර්යභාරය වනුයේ පර්යේෂණ කටයුතු සිදු කර හඳුනාගන්නා ලද නව තාක්ෂණයන් ක්ෂේත්‍රයට ලබාදීම සඳහා පුහුණු, ව්‍යාපෘති සහ සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම වුවද, 2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන ලද එකතු වටිනාකම රු.495,450 ක් වූ පර්යේෂණ 03 ක් සහ 2021 වර්ෂයේ ආරම්භ කළ එකතු වටිනාකම රු.1,726,870 ක් වූ පර්යේෂණ දෙකක අවසන් වාර්තා 2023 ජූලි 31 දින වන තුරුත් ඉදිරිපත් වී නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි ගැටළු මග හරවා ගැනීමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | පර්යේෂණ වාර්තා ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.4 නිෂ්කාර්යය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දින වන විට රසායනාගාරයේ පැවති එකතු වටිනාකම | මෙම උපකරණ දෙක අක්‍රිය වූ මොහොතේ අලුත්වැඩියා කිරීම සඳහා ඉදිරිපත් කළ අධික | යන්ත්‍රය අලුත්වැඩියා කර භාවිතයට ගැනීම |

| | | |
|---|---|---|
| රු.8,336,705 ක් වූ Atomic Absorption Spectrophotometer සහ Handel Wheel Vertical Autoclave යන්ත්‍ර 02 ක අක්‍රියවීම හේතුවෙන් එම යන්ත්‍රය භාවිතා කර කරනු ලබන පර්යේෂණ කටයුතු පිළිවෙලින් 2018 හා 2019 යන වර්ෂවල නවතා තිබුණි. මෙම යන්ත්‍ර අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට 2020 වර්ෂයේ සිට සැලසුම් ගත වැඩපිළිවෙලක් ආයතනය ක්‍රියාත්මක කර නොතිබුණි. | මිල ගණන්වලට යන්ත්‍රය අලුත්වැඩියා කිරීම ප්‍රායෝගික නොවන බැවින්, මේ සම්බන්ධව කෘෂිකර්ම අමාත්‍යාංශය දැනුවත් කර ඇත. කෙසේ වුවද මේ වන විට රටේ ඇතිවී ඇති තත්ත්වය මත නැවත අළුත්වැඩියාව සඳහා මිල ගණන් ඉල්ලා ඇත. එම මිල ගණන් සාධාරණ/ ප්‍රායෝගික යැයි පිළිගතහොත් අලුත්වැඩියාව සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලැබේ. | සඳහා වැඩපිළිවෙළක් සකස් කළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| අනුමත කාර්ය මණ්ඩල වාර්තාවට අනුව ආරක්ෂක සේවාව සඳහා අනුමත මුරකරු තනතුරු හයම පුරප්පාඩු නොවී තිබියදී එම මුරකරු තනතුරු දරන නිලධාරීන් 06 දෙනාගෙන් තිදෙනෙකු නේවාසිකාගාරයේ ආරක්ෂාවටද, ඉතිරි තිදෙනාම කාර්යාල සහායක තනතුරුට අදාළ කාර්යයන් පවරා ප්‍රධාන දොරටුවේ ආරක්ෂක සේවාව සඳහා 2018 පෙබරවාරි සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා කාලය වෙනුවෙන් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ආරක්ෂක නිලධාරින්ගේ සේවාව ලබාගැනීම වෙනුවෙන් එම දෙපාර්තමේන්තුව වෙත රු.13,569,700 ක මුදලක් ගෙවා තිබුණි. ඒ අනුව ප්‍රාථමික මට්ටමේ නිලධාරීන් විසින් සිදුකළ යුතු කාර්යභාරය පිළිබඳ වැඩ අධ්‍යනයක් කර, තත්‍ය සේවකයින් මඟින් හෝ අනුමත කාර්ය මණ්ඩල වාර්තාවට අනුව අදාළ නිලධාරීන්ගෙන් එකී කාර්යභාරයන් ඉටු නොකර වෙනත් ආයතනයකින් ඉටු කරවා ගැනීම නිසා සිදු වී ඇති අරපිරිමැසුම් රහිත උක්ත ගෙවීමට කළමනාකරණය වගකිව යුතු බව නිරීක්ෂණය විණි. | අධ්‍යක්ෂ පත්‍රිකා BP 975 මඟින් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවෙන් ආරක්ෂක සේවාව ලබාගැනීමට තීරණය කරන ලදි. විගණනය පෙන්වා දෙන පරිදි සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සේවාව නතර කිරීමට කටයුතු කරන්නේ නම් ඒ සඳහා දැනට සිටින නිලධාරින්ට අමතරව අලුතින් ඒ සඳහා ආරක්ෂක නිලධාරින් අවම වශයෙන් 02 නකු වත් පත්කර ගත යුතුව ඇත. එසේ පත් කර ගැනීමට මේ අවස්ථාවේ බඳවා ගැනීමට හැකියාවක්ද නොමැත. එබැවින් නැවත ආරක්ෂක අංශය වෙනස් කිරීම ගැටළු සහගත තත්වයකට පත්වනු ඇත.<br>මෙම මුර සේවය සඳහා යොදවා ගෙන සිටින 06 දෙනා PL1සේවා ගණයේ සේවා වන බැවින් ඔවුන්ද කාර්යාල සහයක, නඩත්තු සහයක සමාන තනතුරක් දරන බැවින් සේවා අවශ්‍යතාවය මත එම තනතුරු වලට අදාලව රාජකාරී පවරා ඇති බව පෙන්වා දෙමි. | විගණන නිරීක්ෂණය සමාලෝචනය කර නිරවුල් කිරීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් ගත යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 සමාජ වගකීම් ඉටු කිරීම**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) 2016 වර්ෂයේ සිට 2019 අගෝස්තු මාසය දක්වා කාලය තුළ ක්‍රියාත්මක කර තිබූ පළතුරු ඉදවීමට කාබනික ක්‍රම හඳුන්වාදීමේ පර්යේෂණයේ (Induction Of Fruit Ripening By Organic method) සොයා ගැනීම් සඳහා පේටන්ට් අයිතිය ලබා ගැනීම හා පර්යේෂණයේ ප්‍රතිඵල වාණිජ මට්ටමින් ප්‍රචලිත කිරීම සඳහා රු.9,572,715ක් වැය කර තිබුණද, විගණිත දිනය වූ 2023 දෙසැම්බර් 31 දින වන විටද ව්‍යාපෘතිය ක්‍රියාකාරී මට්ටමේ නොතිබුණි. | කාබනික ක්‍රම මඟින් පලතුරු ඉදවීම උත්තේජනය (Induction of fruit ripening by organic methods) යන පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා මෙම මුදල වැයවී ඇත්තේ පලතුරු ඉදවීමේ ක්‍රියාවලියට අදාලව අත්‍යවශ්‍ය විද්‍යාගාර විශ්ලේෂන කටයුතු කිහිපයක් සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට වන අතර, මේ ආශ්‍රිතව පර්යේෂණ ප්‍රකාශන 03ක් සිදු කොට ඇත. තවද හඳුනාගත් තාක්ෂණයන් වාණිජව භාවිතා කිරීමේ ශක්‍යතාව අඩු බව හඳුනා ගැනින. වාණිජ මට්ටමේ ශක්‍යතාව අඩු නිසා පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම සිදු නොවිනි.<br><br>මේ සඳහා අවශ්‍ය GC යන්ත්‍රයක්, ජෙනරේටරයක්, Refrigerated Centrifuge යන උපකරණ ලබා ගැනීමට රුපියල් අසූ දෙලක්ෂයක පමණ මුදලක් වැය වී ඇති අතර, මෙම උපකරණ දැනටමත් භාවිතයේ පවතී. | විගණන නිරීක්ෂණයන් සමාලෝචනය කර නිරවුල් කිරීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයන් ගත යුතුය. |
| (ආ) 2017 වර්ෂයේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන යටතේ ආනයන කරනු ලබන ආහාර වර්ග 07 ක, බැරලෝහ වර්ග 04 ක් අන්තර්ගතව තිබේද යන්න පරීක්ෂා කිරීමට ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘතිය සඳහා 2017 වර්ෂයේ රු.1,956,120 ක වියදමක් දරා නියැදි 500 ක් පරීක්ෂා කර තිබුණි. ඊට අදාළ ව්‍යාපෘති වාර්තාව අනුව ඇතැම් ආහාර ද්‍රව්‍යවල උපරිම ආරක්ෂක මට්ටම ඉක්මවා Cadmium, Arsenic And Leaf වැනි බැරලෝහ අන්තර්ගත බව තහවුරු කරගෙන තිබුණි.<br>එසේ වුවද, එම වාර්තාවේ නිගමන හා යෝජනා අනුව බැරලෝහ අන්තර්ගත ආහාර ද්‍රව්‍යයන් පිළිබඳ වැඩිදුර පරීක්ෂාවක් ආයතනය විසින් සිදුකර, ඒ සම්බන්ධව වගකිවයුතු සියළුම පාර්ශව වෙත | ව්‍යාපෘතියේ මූලික සැලසුම අනුව අවසන් වාර්තාව නිකුත් කිරීමට සැලසුම් කරන ලද්දේ සාම්පල 1000 පරීක්ෂා කිරීමෙන් පසුව බැවින් සාම්පල 500 ක් පළමු වසරේදී විශ්ලේෂණය කරන ලදී. නමුත් ඊලග සාම්පල 500 විශ්ලේෂණය කිරීම සඳහා මුදල් ලබා නොදුන් බැවින් එම විශ්ලේෂණය කරන ලද සාම්පල 500 වාර්තාව ඉදිරි කටයුතු සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයට බාර දී ඇත. මෙම පර්යේෂණයට අදාලව පර්යේෂණ පත්‍රිකාවක් 2019 වසරේදී ප්‍රකාශයට පත් කර ඇත. | විගණන නිරීක්ෂණයන් සමාලෝචනය කර නිරවුල් කිරීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයන් ගත යුතුය. |

නිසි ක්‍රියාමාර්ග ගැනීම සඳහා තොරතුරු ලබාදී නොතිබුණි. මේ සම්බන්ධයෙන් ජාතික විගණන කාර්යාලය විසින් 2023 වර්ෂයේ අමාත්‍යාංශයේ පැවති විගණන හා කළමනාකරණ කමිටුවේ අවධානයද යොමුකර ඇතත් පර්යේෂණ සඳහා වැය වූ මුදල නිශ්කාර්ය වියදමක් බවට පත් වෙමින් පැවතිණි.